# කොළඹ විශ්වවිද්‍යාලය
# ශාස්ත්‍ර පීඨය
# ශාස්ත්‍රවේදී උපාධි දෙවන වසර පරීක්ෂණය (සාමාන්‍ය උපාධි)
# දෙවන සෙමෙස්තරය - 2017/2018
# SLG 2219- නිර්මාණාත්මක ලේඛනය

(කාලය පැ දෙකයි)

**පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**

1. <u>එක්කෝ</u>

   "මළවුන්ගේ අවුරුදු දා" නවකතාව රචනයේ දී එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් උපයෝගී කරගන්නා ලද නිර්මාණාත්මක භාෂාවෙහි ලක්ෂණ විභාග කරන්න.

   <u>නැතහොත්</u>

   " මානව චර්යා රටා පිළිබඳ ගැඹුරු දෘෂ්ටිමය විවරණයක් ලෙස මළවුන්ගේ අවුරුදු දා නවකතාව සැලකිය හැකි ද? " සාකච්ඡා කරන්න.

2. "කලාකරුවා යථාර්ථය ජය ගැනීමෙහි නිරත වූවෙකි." විමසන්න.

3. "සාහිත්‍ය කෘතියකින් සහෘදයා ලබන බුද්ධිමය වින්දනයෙහි තීරක සාධකය වන්නේ, ලේඛකයාගේ ජීවන දෘෂ්ටිය යි" නූතන සිංහල පද්‍ය නිර්මාණ ඇසුරින් විමසන්න.

4. "සාහිත්‍යය හා සමාජය අතර පවතින්නේ අන්‍යෝන්‍ය වූ අවියෝජනීය බැඳීමකි" සනිදර්ශන ව විමසන්න.

5. "පරිකල්පන ශක්තිය කවරාකාර අත්දැකීමක් ප්‍රතිනිර්මාණයේ දී වුව අත්‍යන්තයෙන් ම වැදගත් වන්නේ ය " විමසන්න.

අ.පි.බ.

6. "අනුකරණයට පියවරක් ඉදිරියෙන් ආදර්ශය සිටියි." සාහිත්‍යයික නිදසුන් ඇසුරෙන් මේ මතය විමසන්න.

7. <u>එක්කෝ</u>

සම්භාව්‍ය සිංහල ගද්‍ය සාහිත්‍යකරුවන් විසින් අවස්ථා නිරූපණයේ දී යොදාගන්නා ලද රචනෝපක්‍රම කවරේද යන්න බුත්සරණෙහි නාලාගිරි දමනය ප්‍රමාණ කොටගෙන විමසන්න.

<u>නැතහොත්</u>

තමා අවටැති පරිසරය සංකල්ප රූප ජනනය වන පරිද්දෙන් ප්‍රතිනිර්මාණය කිරීමට සැලලිහිණි සන්දේශකරුවා දැක් වූ ශක්‍යතාව සනිදර්ශන ව සාකච්ඡා කරන්න.

8. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකක් (2) පිළිබඳ කෙටි සටහන් ලියන්න

I. පද්‍යයෙහි උපයුක්ත ශබ්දාලංකාර

II. ව්‍යංග්‍යාර්ථ

III. ව්‍යුත්පත්තිය

IV. විභාව

********************